මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය - 2022
-----------------------------------------

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ඔක්තෝබර් 04 දින එළඹි අංක 6006 දරන මූල්‍යකරණ ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණය මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

මූල්‍යකරණ ගිවිසුමට අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රීලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රීලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින් අතර මූල්‍ය වෙළඳපොල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ මූල්‍ය සේවා භාවිතය ඉහළ නැංවීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍යකරණය, ආයෝජනය පදනම් වූ මූල්‍යකරණය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඉදිරිපෙළ ගාස්තුව යන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍යකරණ ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 22,500 කට සමාන එජඩො මිලියන 75 ක් වන අතර මුළු මුදලම මූල්‍යකරණය කිරීමට අන්තර්ජාතික සංවර්ධන සංගමය (IDA) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 18 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3** තත්වාගණනය කළ මතය

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරික්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

**2.1** මූල්‍ය කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 21 හි ඡේද අංක 39(අ) ප්‍රකාරව විදේශ ණය සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති වලට අදාල සමානාත්මතා ගැලපුම් (Parity Adjustment) වටිනාකම රු.මිලියන 1,978 ක් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය විසින් මුළු ණය මුදලින් සියයට 15 ක් | පිළිතුරු ලබාදී නොතිබුණි. | වෙන් කර ඇති මුළු අරමුදල් ප්‍රමාණය |

| | | |
|---|---|---|
| පමණක් උපයෝජනය කර තිබුණි. උපයෝජනය නොකරන ලද ණය සඳහා සියයට 2.5 ක බැඳීම් ගාස්තු (Commitment Charges) ගෙවීමට ව්‍යාපෘතිය බැඳී සිටින අතර දෙසැම්බර් 31 දිනට එජඩො 159,389 ක බැඳීම් ගාස්තු ආර්ථික නොවන ලෙස ණය ලබා දෙන නියෝජිතායතනය වෙත ගොවා තිබුණි. | | අපේක්ෂිත පරිදි භාවිතා කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.2 භෞතික කාර්ය සාධනය

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | අත්පත් කරගත් කාර්ය සාධනය | | | |
| සංරචක 01 | ඒකක 09 උපයෝජනය හා සබැඳි ප්‍රතිඵල (DLR) | ඒකක 03 උපයෝජනය හා සබැඳි ප්‍රතිඵල | මෙම සංරචකය යටතේ ක්‍රියාකාරකම් 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. 2022 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබූ ක්‍රියාකාරකම් අතරින් 2022 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරකම් 06 ක් ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අපේක්ෂිත පරිදි සියළු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| සංරචක 02 | ඒකක 25 උපයෝජනය හා සබැඳි ප්‍රතිඵල (DLR) | ඒකක 04 උපයෝජනය හා සබැඳි ප්‍රතිඵල | මෙම සංරචකය යටතේ ක්‍රියාකාරකම් 25 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. 2022 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබූ ක්‍රියාකාරකම් අතරින් 2022 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරකම් 21ක් ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අපේක්ෂිත පරිදි සියළු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වීම. |